# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,073 - 2018 මැයි මස 25 වැනි සිකුරාදා - 2018.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 276 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 278 |


*සැ. යු.* - සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජූනි මස 14 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූනි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

275- B 081284 — 353 (2018/05)
D 1 -

# පිස්කල් විකිණීම්

## දිසා අධිකරණය - මාරවිල

අංක 141/එර් දරන නඩුවට අදාළව මාරවිල දිසා අධිකරණයේ පිස්කල් මගින් කරනු ලබන

**වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, දකුණු පිටිගල් කෝරලයේ, මැද පළාතේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාතුළ පිහිටි නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 504/බී පහල මාවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මුදුකටුව නැමැති ගමේ පිහිටි කිනකැලේ වත්ත නැමැති ඉඩමට, ඩබ්. එල්. එච්. ප්‍රනාන්දු බලයලත් මානක තැන විසින් 2010.08.24 වැනි දින මැන සාදන ලද අංක 9620 දරන පිඹුරේ ප්‍රකාර ලොට් අංක 01 දරන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

*ඉඩමේ ප්‍රමාණය*.- අක්ඃ 00, රූඩ්ඃ 00 පර්ඃ 19.00

ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ. අංක 2346/97 දරන පිඹුරේ ලොට් අංක 03 දරන අඩි 10ක් පළල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් භාවිතා කිරීමේ අයිතිය ද මේ සමග වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 128/30හි ලියාපදිංචි වී ඇත.

*දේපලට පිවිසීම*.- A3 ප්‍රධාන මාර්ගය ඔස්සේ මාරවිල සිට මීගමුව දෙසට කි. මී. 2ක් පමණ ගියවිට පාරේ වම්පසින් මාරවිල රජයේ රෝහල හමු වේ. එය පසුකර මීටර් 200ක් පමණ ගියවිට වම්පැත්තට ඇති මාරවිල පාරේ මීටර් 600ක් පමණ ගොස් (ඉතාලියන් ගේට් පසුවූ විට) දකුණ දෙසට ඇති පාරේ මීටර් 300ක් පමණ ගියවිට වම්පසට ඇති මාවතක් හමු වේ. එම මාවතේ අවසානයේ අදාළ සුරුකුම් දේපල පිහිටා ඇත.

නි/පිස්කල් විසින් 2018 ජුනි මස 21 වැනි බ්‍රහස්පතින්දා දින පෙ.ව. 10.30ට දේපළ පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් (සියයට එකක) විකුණුම් බදු ;
3. පිස්කල් කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාර) ;
4. සියලුම ප්‍රචාරක ගාස්තු ;
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500.00 ;
6. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම් ;
7. විකිණුම් සහතිකය සඳහා මුද්දර බදු.

අදාළ දේපළ විකිණීම උසාවිය අනුමැතිය මත සිදු වේ.

ගැණුම් මිලෙන් 75% (සියයට හැත්තෑපහක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ඇතුළත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් මුදලින් තැන්පත් කළ මුදල් ආපසු නොගෙවන අතර දේපළ නැවත වෙන්දේසි කිරීමට ක්‍රියා කරනු ඇත.

අදාළ ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂාව සහ වැඩි විස්තර ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙතින් ලබාගත හැක.

දුරකථන : 032 2253300, 032 2253301
ෆැක්ස් : 032 2255247

රෙජිස්ට්‍රාර්/නි/ පිස්කල්,
දිසා අධිකරණය,
මාරවිල.

05-745

## හම්බන්තොට දිසා අධිකරණයේ උකස් නඩු තීන්දුවක් යටතේ

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

නඩු අංකය : එම්. බී. 7117

මහජන බැංකුව සිය ප්‍රධාන කාර්යාලය, අංක. 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටියා වූ ද සිය සූරියවැව ශාඛා කාර්යාලය, සූරියවැව, සූරියවැව නගරය දරන තැන පිහිටියා වූ ද මහජන බැංකුව.

............................*පැමිණිලිකරු.*

*එදිරිව*

ජගත් ප්‍රසන්න වික්‍රමනායක,
පන්සල පාර, මීගහජඳුර, සූරියවැව.

..................................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ 2015.05.19 වැනි දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය සහ 2018.03.20 වැනි දින මා වෙත නිකුත් වී ඇති විකිණීමේ ආඥාව අනුව ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු රුපියල් පහලොස් ලක්ෂ තිස් පන් දහස් විසිතුනයි ශත පනහ (රු. 1,535,023.50)ක මුදලක්ද තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය ද නඩු ගාස්තු ද මේ දක්වා ගෙවීමට අපොහොසත් වී ඇති හෙයින් එම මුදල් අයකරගැනීමට බැංකුවට උකස් කර ඇති පහත උපලේඛණයේ සවිස්තරව දක්වා ඇති විත්තිකරුට අයත් දේපල සහ පරිශ්‍රය,

වර්ෂ 2018ක් වූ ජුනි මස 21 වැනි දින පෙ.ව. 11.00 සිට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම* : සූරියවැව බස් නැවතුම්පලේ සිට මීගහජඳුර පාරේ කිලෝ මීටර් 08ක් පමණ ඉදිරියට ගිය විට හමුවන මීගහජඳුර හන්දිය පසුකර තවත් මීර් 50ක් පමණ ඉදිරියට ගිය විට වම් පසට හැරී කොන්ක්‍රීට් පාරෙ තවත් මීටර් 200ක් පමණ ඉදිරියට ගිය විට පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත දැක්වෙන පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. 1. ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%) 2. පළාත් අධිකාරියට විකුණුම් බදු (පවතින නීතිය අනුව) 3. වෙන්දේසිකරුගේ කොමිස් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහ (2.5%) 4. තක්සේරු ගාස්තු 5. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 2,000.00 6. *ගැසට් පත්‍රයේ* ගාස්තු පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ඇතුළු වෙන්දේසියේ සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් සියළුම වෙන්දේසි වියදම් ද එවෙලේම මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75% වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත හම්බන්තොට දිසා අධිකරණයේ එකී එම්. බී. 7117 දරන නඩුවට තැන්පත් කළ යුතුය. එසේ නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25% ක මුදල ආපසු නොගෙවීමටත් සහ දේපළ නැවත විකිණීමටත් පැමිණිලිකාර බැංකුවට බලය ඇත.

*හිමිකම් ඔප්පු පරීක්ෂාව* : සූරියවැව මහජන බැංකුවෙන් විමසන්න.
දුරකථන අංක : 047 - 2289202/ෆැක්ස්
අංක : 047 - 2289070

*වැඩි විස්තර* : මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, හම්බන්තොට
විමසන්න,
දුරකථන අංක : 047 - 2220903/047 - 2220902

උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහළ කුඹුක්වැව ග්‍රාම සේවා වසමේ, මීගහජඳුර නමැති ගමේ පිහිටා ඇති "බෝගහවත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ මහතා විසින් මැන සම්පාදිත 2007.03.03 දිනැති අංක : හ/6034 දරන පිඹුර ප්‍රකාරය "බී" අක්ෂරය දරන ඉඩමට මායිම් :-

උතුරට : එෆ්. ටී. පී. 4හි කැබැලි අංක 337 ද,
නැගෙනහිරට : එෆ්. ටී. පී. 4හි කැබැලි අංක 340 ද,

දකුණට : එෆ්. ටී. පී. 4හි කැබැලි අංක 342 ද,
බස්නාහිරට : එකී අංක හම්/ 6034 දරන පිඹුරේ ලොට් "ඒ" ද,

යන සතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි බිංදුවයි තුනයි පහ (හෙක්: 0.3035)ක් *හෙවත්* රූඩ් තුනයි පර්චස් එකයි දශම හතර (අක්. 00, රූ. 03, පර්. 1.4) ක් විශාල ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් වේ. මෙම ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හම්/139/1089/97බී දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

එන්. එච්. පී. පී. ආරියරත්න,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරු සහ උසාවි කොමසාරිස්.

කුරුඳුවත්ත, වල්ගම, මාතර.
දුරකථන අංක : 071-1885677/077-3281956.

05-746

---

# විවිධ දැන්වීම්

## දැදිගම ශ්‍රී මෛත්‍රී පඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

බන්දුල ගුණවර්ධන වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පත් අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සභාව සංස්ථාගත කිරීමයි.

1. බොදු පිළිවෙත් පුරණ නිවන් මග අරමුණ කර ගත් ප්‍රතිපත්ති පූජාවට මුල්තැන දී කටයුතු කරන ගිහි පැවිදි පිරිසක් බිහිකර ගැනීම.

2. එම සිව්වනක් පිරිසගේ ධර්ම ඥානය උදෙසා දහම් ග්‍රන්ථ ඉදිරිපත් කිරීම හා නවක පිරිස් වෙනුවෙන් දෛනිකව, සීල, සමාධි, ප්‍රඥ වැඩීම, ධර්ම සාකච්ඡා පැවැත්වීම හා ධර්ම අනුශාසනා ශ්‍රවණයට ඉඩ ප්‍රස්ථා සලසා දීම.

3. දහම් සභාවට අයත් වන ආයතනයන්හි, සිව්වනක් පිරිසගේ විනය ගරුත්වය උදෙසා දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ නා හිමියන් විසින් අනුදැන වදාළ කථිකාවත් සුරක්ෂිත කොට ක්‍රියාවට නැංවීමට පියවර ගැනීම.

4. මෙම දහම් සභාවේ විශේෂිත අරමුණු වන්නේ ය.

බන්දුල ගුණවර්ධන,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

05-598

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.